# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව |
| දිනය | 2024.12.13 |

**විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය තුළින් ශ්‍රී ලංකා දේශීය විදේශ විනිමය වෙළඳ පොළෙහි ඉදිරි කටයුතු වැඩි දියුණු කිරීම**

2024 ජනවාරි මස ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා ඇති පරිදි, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, සියලු ම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඇතුළත්, දේශීය විදේශ විනිමය වෙළඳ පොළ සාර්ථක ලෙස විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහයට අනුගත වීම සිදුවූ අතර, ඒ අනුව සමස්තයක් වශයෙන් දේශීය විදේශ විනිමය වෙළඳ පොළ සහභාගිවන්නන් ආචාර ධර්ම සහ ඵලදායී ක්‍රියාකාරිත්වය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා වන පොදු මාර්ගෝපදේශ මාලාවක් අනුගමනය කරනු ඇත. විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය දේශීය විදේශ විනිමය වෙළඳ පොළ තුළ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලිකත්වයෙන් සහ ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ සහයෝගයෙන් ආරම්භ කළ ව්‍යාපෘතියක ප්‍රතිඵලයක් වන අතර, එය දේශීය විදේශ විනිමය වෙළඳ පොළෙහි සුවිශේෂී ප්‍රගතියක් සනිටුහන් කරයි.

විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය යනු ලොව පුරා නෛතික බල ප්‍රදේශ විස්සක පවත්නා මහ බැංකු සහ වෙළඳ පොළ සහභාගිවන්නන් අතර හවුල්කාරිත්වයක් මගින් වැඩි දියුණු කරන ලද, විදේශ විනිමය වෙළඳ පොළෙහි යහපත් භාවිතාව සඳහා පවතින ගෝලීය මූලධර්ම සමූහයකි. මෙය 2017 වසරේ දී මුලින්ම හඳුන්වාදුන් අතර, එහි අරමුණ වනුයේ වෙළඳ පොළ තොරතුරු පිළිබිඹු කරන තරඟකාරී මිල ගණන් යටතේ, විශ්වාසයෙන් හා ඵලදායී ලෙස වෙළඳ පොළ සහභාගිවන්නන්හට ගනුදෙනු කිරීමට හැකි ශක්තිමත් හා සාධාරණ මෙන්ම ද්‍රවශීල, විවෘත සහ සුදුසු විනිවිදභාවයක් සහිත වෙළඳ පොළක් ප්‍රවර්ධනය කිරීම සඳහා පොදු මාර්ගෝපදේශ මාලාවක් සැපයීමයි.




විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහයට අනුගත වීම මගින් සහභාගිවන්නන් විසින් ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළඳ පොළ තුළ වඩාත් සහසම්බන්ධ පරිසරයක් නිර්මාණය කරමින් වෙළඳ පොළ සහභාගිවන්නන් අතර විශ්වාසය තවදුරටත් ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, එය ආර්ථිකයේ ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා තීරණාත්මක වන අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය යන අංශයන්හි විශිෂ්ට පරිචයන් භාවිතය ප්‍රවර්ධනය කරනු ඇත.

මූලධර්ම පනස්පහකින් සමන්විත විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය මගින් දැනට පවත්නා නීති, රීති සහ රෙගුලාසි වලට බලපෑමක් ඇති නොකරන අතර, එහි අරමුණ මෙම නීති, රීති සහ රෙගුලාසි අනුපූරණය කිරීමයි. ආචාර ධර්ම, පාලනය, ගනුදෙනු කිරීම, තොරතුරු හුවමාරු කර ගැනීම, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ ගනුදෙනු තහවුරු කිරීම සහ පියවීම යන අංශවලට අදාළව ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ට පරිචයන් සහ ක්‍රියාවලි මෙම මූලධර්ම මගින් ආවරණය කරයි.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහයෙහි දක්වා ඇති විශිෂ්ට පරිචයන් පිළිගැනීම සහ ඒවා අනුගමනය කිරීමට එකඟතාවය දක්වන අනුගත වීමේ ප්‍රකාශයන් ඔවුන්ගේ අදාළ වෙබ් අඩවිවල සටහන් කර ඇත. විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහයට අනුගත වීම සඳහා තම කැපවීම ප්‍රකාශ කර ඇති ශ්‍රී ලංකා දේශීය විදේශ විනිමය වෙළඳ පොළ සහභාගිවන්නන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන පොදු ලේඛනය ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ වෙබ් අඩවියේ https://srilankaforex.org/market-participants.php වෙබ් සබැඳිය හරහා පරිශීලනය කළ හැක. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුගත වීමේ ප්‍රකාශය https://www.cbsl.gov.lk/si/මූල්‍ය-පද්ධතිය/මූල්‍ය-වෙළෙඳපොළ/විදේශ-විනිමය-පිළිබඳ-ගෝලීය-ප්‍රශස්ත-භාවිත-සංග්‍රහයට-අනුගත-වීම වෙබ් සබැඳිය හරහා පරිශීලනය කළ හැක.